*සැ. යු.-* 2017.02.09 දින පළ වූ අංක 2006 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,007 - 2017 පෙබරවාරි මස 17 වැනි සිකුරාදා - 2017.02.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 282 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 305 |

*සැ. යු.* - සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මාර්තු මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**නීති නිලධාරි (විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව - 01

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම/ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය පළපුරුද්ද.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170- රු. 1,10,895 (SL - 1 - 2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (*උදා* : 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අදළ වනුයේ රු. 32,807 ක මූලික වැටුපක් හා රු. 4,715 ක ගැලපුම් දීමනාවකි.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්*** :<br>රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | 20 |

| | විෂයය | උපරිම ලකුණු | |
|---|---|---|---|
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 20<br>15<br>10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | *සටහන.*-ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10ක් ලබා දිය යුතුයි. | | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. | ***අතිරේක වෘත්තීය සුදුසුකම් :*** | | 15 |
| | නීතිය පිළිබඳ ආචාර්ය උපාධිය | 15 | |
| | නීතිය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධිය | 10 | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් - උපරිම ලකුණු 15) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ලද අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින් - උපරිම ලකුණු 15) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින් - උපරිම ලකුණු 10) | | |
| 03. | ***අතිරේක පළපුරුද්ද :*** | | 30 |
| | නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද -<br>මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර). | | |
| | (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | |
| 04. | ***ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :*** | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය). | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය 720<br>-මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | <br><br><br><br>07<br>05 | |
| 05. | ***තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :***<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදරා තිබීම සඳහා | 15 | 15 |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06 පැය 720<br>- මාස 03 පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | <br><br>07<br>05 | |
| 06. | ***සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව :*** | | 05 |
| | මුළු එකතුව | | 100 |

07. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(*අ*) අයදුම්පත් 2017.03.10 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(*ආ*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වාත් දෙවන පිටුව අංක 09 සිට 13 දක්වාත් තෙවන පිටුව 14 සිට 15.2 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, හෝ රු. 47,615 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(*ඉ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඊ*) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්.

ඉඩම් අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. මුලකුරු සමඟ නම (මයා/මිය/මෙනවිය) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

01.1 මුලකුරු වලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

03.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - M, ස්ත්‍රී - F ) :

05. විවාහක/අවිවාහක බව :———.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

07. දුරකථන අංකය : ස්ථාවර :———. ජංගම :———.

08. නීති උපාධිය පිළිබඳ විස්තර :

(i) විශ්ව විද්‍යාලය :————.

(ii) උපාධිය පිරිනැමූ දිනය :————.

09. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

10. නීතිඥයෙකු ලෙස සක්‍රීය පළපුරුද්ද (වසර ගණන) :———.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 ඡේදය අනුව සුදුසුකම් :

(i) ————.
(ii) ————.
(iii) ————.
(iv) ————.
(v) ————.

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව්/නැත.

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන....................... නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ........... දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ
අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ,
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයා ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්වී නැත/ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

02-782

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරින් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව
(ඇ) පරිපාලන ශාඛාව
(ඈ) වෛද්‍ය ශාඛාව
(ඉ) පාලන පශු වෛද්‍ය ශාඛාව
(ඊ) පාලන නීති ශාඛාව
(උ) පාලන තූර්යවාදක ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) *කාර්මික ඉංජිනේරු ශාඛාව* :

කාර්මික ඉංජිනේරු නිලධාරි (ගුවන් යානා) - පිරිමි (නිත්‍ය)

* ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිව් (4) අවුරුදු පූර්ණ කාලීන ගුවන් යානා ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය ලබා තිබීම.

(තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් මත ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයෙහි අධිකාරිලත් නිලධාරින් ලෙස බඳවා ගනු ලැබේ.)

කාර්මික ඉංජිනේරු නිලධාරි (සාමාන්‍ය) - පිරිමි (නිත්‍ය)

* ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිව් (4) අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික/මෝටර් රථ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද තුන් (3) අවුරුදු පූර්ණකාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී.) හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පිරිනමන ලද අවුරුදු තුන හමාරක (3 1/2) පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (එච්. එන්. ඩී. ඊ.) ලබා තිබීම, පාඨමාලාව සමත්වීමෙන් පසුව යාන්ත්‍රික/මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයේ එක් (01) වසරක පළපුරුද්ද ලබා තිබිය යුතු ය.

(තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හෝ ෆලයින් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරින් ලෙස බඳවා ගනු ලැබේ.)

(ආ) *විද්‍යුත් ඉංජිනේරු ශාඛාව* :

ජාල කළමණාකාර නිලධාරින් - පිරිමි (නිත්‍ය)

* සිව් (4) අවුරුදු පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ තුන් (3) අවුරුදු පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ උසස් ජාතික ඩිප්ලෝමාවක් හෝ ජාතික කළමණාකරණ (NIBM) ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග ජාල කළමණාකරණය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබිය යුතු ය.

මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරින් - පිරිමි (නිත්‍ය)

* සිව් (4) අවුරුදු පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ තුන් (3) අවුරුදු පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයන් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ උසස් ජාතික ඩිප්ලෝමාවක් හෝ ජාතික කළමණාකරණ (NIBM) ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග ASP.NET සහ C # .NET භාවිතයෙන් මෘදුකාංග නිර්මාණය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබිය යුතු ය.

* සෑම අයදුම්කරුවකුම ලිඛිත සහ ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය.

(තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හෝ ෆලයින් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරින් ලෙස බඳවා ගනු ලැබේ.)

* සෑම විද්‍යාවේදී උපාධියක්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් විය යුතු ය.

(ඇ) පරිපාලන ශාඛාව :

පරිපාලන නිලධාරින් - පිරිමි /කාන්තා (නිත්‍ය)

* පිළිගත් විශ්වවිද්‍යාලයක වානිජවේදී/කළමණාකරණ/කලා උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සමග කළමණාකරන/ගණකාධිකරණය පිළිබඳව අදළ ක්ෂේත්‍රයේ වෘත්තීය පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම ;හෝ

* වරලත් ගණකාධිකරණය පිළිබඳ විශිෂ්ට නිපුණතාවයක් හා විගණනය පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම, හෝ

* මානව සම්පත් කළමණාකරණය පිළිබඳ එක් වසරක ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතු අතර කළමනාකරණය/ගණකාධිකරණය පිළිබඳ අදළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) එක් වරක දී අවම වශයෙන් විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාවට සහ ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම; හෝ

* වරලත් ගණකාධිකාරින්ගේ අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබිය යුතු අතර කළමණාකරණය/ගණකාධිකරණය පිළිබඳ අදළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) එක් වරක දී අවම වශයෙන් විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාවට සහ ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතු ය.

(තෝරගනු ලබන අයදුම්කරුවන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත ෆ්ලයින් ඔෆිසර් හෝ පයිලට් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරින් ලෙස බඳවා ගනු ලැබේ.)

(ඈ) *වෛද්‍ය ශාඛාව* :
වෛද්‍ය නිලධාරින් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)
* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්* .- පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතු ය.

(ඉ) *පාලන පශු වෛද්‍ය ශාඛාව* :

පශු වෛද්‍ය නිලධාරි - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)

* *ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්* : පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ පශු වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම.

(ඊ) *පාලන නීති ශාඛාව* :

නීති නිලධාරි - කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

* ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම, වාණිජ ගිවිසුම්, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය, අධිකරණ නඩු මෙහෙයවීම සහ විනය පරීක්‍ෂණ පිළිබඳ විශේෂඥතාවය සහ/හෝ පළපුරුද්ද,

(වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මත තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයෙහි අධිකාරියට පත් කරනු ලැබේ.)

(උ) *පාලන තූර්ය වාදක ශාඛාව* :

තූර්ය වාදක නිලධාරි - බටහිර සංගීත කණ්ඩායම (මිලිටරි රොක් බෑන්ඩ්) - පිරිමි (නිත්‍ය)

* එක් වතාවකදී අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුලත්ව අවම වශයෙන් සම්මාන 04ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම;

සහ

* ලන්ඩන් සංගීත විභාගය රාජකීය විද්‍යාලයේ/ට්‍රිනිටි විද්‍යාලයේ 5 වන ශ්‍රේණිය දක්වා හෝ එයට වැඩි හෝ එයට සමාන සුදුසුකම් ලබාතිබීම,

* තූර්ය වාදක කණ්ඩායම පුහුණු කිරීමේ සහ වාදක සමූහයක් විසින් වාදනය කළ හැකිසේ සංගීත ප්‍රස්ථාරයන් සකස් කිරීමට ඇති හැකියාව සහ අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් සංගීත විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

* පෙරදිග සහ අපරදිග සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥනය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

තූර්ය වාදක නිලධාරි - පෙරදිග සංගීත කණ්ඩායම (ඕරිඅන්ටල් ඕර්චේස්ට්‍රා - පිරිමි (නිත්‍ය)

* එක් වතාවක දී අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළත්ව අවම වශයෙන් සම්මාන 04ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම;

සහ

* ශ්‍රී ලංකාවේ ලලිතකලා ආයතනයක දී ලබාගත් සෞන්දර්ය උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත විභාගයේ (සංගීත) අවසාන විභාගයෙන් හෝ ඉන්දියාවේ ''භාත්කාණ්ඩෙ'' සංගීත පීඨයේ දෙවන පංතියේ ''විශාරද'' විභාගය සමත් විය යුතුය.

* පෙරදිග සහ අපරදිග වාද්‍යය පුහුණුකිරීමේ හැකියාව සහ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සංගීත විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

* පෙරදිග හා අපරදිග සංස්කෘතික සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව මෙන්ම ස්වර ඥනය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

තූර්ය වාදක නිලධාරි - නර්තන කණ්ඩායම (කල්චරල් ට්‍රූප්) - පිරිමි (ස්වේච්ඡා)

* එක් වතාවක දී අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළත්ව අවම වශයෙන් සම්මාන 04ක් සහ සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම

සහ

* ශ්‍රී ලංකාවේ ලලිතකලා ආයතනයක දී ලබාගත් නර්තන උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ ජාතික නැටුම් හා සංගීත (නර්තන) අවසාන විභාගය සමත් විය යුතුය.

* දේශීය හා විදේශීය නර්තන පිළිබඳ නව නිර්මාණ බිහිකිරීමේ හැකියාව, පෙරදිග සහ අපරදිග වාද්‍යය පුහුණුකිරීමේ හැකියාව සහ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් නර්තන විෂය සඳහා සම්මාන සාමාර්ථයක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

(තෝරාගනු ලබන අයදුම්කරුවන් පයිලට් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලැබේ.)

3. **අනෙකුත් සුදුසුකම් :**

| | | | |
|---|---|---|---|
| (*අ*) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි; |
| (*ආ*) | සිවිල් තත්ත්වය | : | විවාහක/අවිවාහක |
| (*ඇ*) | ස්ත්‍රී පුරුෂ භාවය | : | පිරිමි/කාන්තා (අදාළ පරිදි) |
| (*ඈ*) | වයස | : | 2017 මැයි මස 20 දිනට |

(1) කාර්මික ඉංජිනේරු ශාඛාව සහ
විද්‍යුත් ඉංජිනේරු ශාඛාව සඳහා : අවුරුදු 18 සිට අවුරුදු 30 දක්වා

(2) පරිපාලන ශාඛාව, වෛද්‍ය ශාඛාව,
පාලන පශු වෛද්‍ය ශාඛාව, පාලන
නීති ශාඛාව සහ
පාලන තූර්ය වාදක ශාඛාව සඳහා : අවුරුදු 18 සිට 35 දක්වා

(ඉ) උස : පිරිමි - අඩි 5යි අඟල් 6ක් හෝ ඊට වැඩි විය යුතුයි;
(වෛද්‍ය ශාඛාව - අඩි 5 අඟල් 5ක් හෝ ඊට වැඩි විය යුතුය)
කාන්තා - අඩි 5යි අඟල් 4ක් හෝ ඊට වැඩි විය යුතුයි;

(ඊ) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{BMI} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස}^{2}\text{ (මී)}}$$

(උ) පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුයි. (පිරිමි)

(ඌ) වර්ණ දෘෂ්ටිය : සීපී 2

(එ) දෘෂ්ටි තීක්‍ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිතව)
(වෛද්‍ය ශාඛා අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ටි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම්, එය උපැස් සහිතව 6/6 තත්ත්වයට තිබීම අනිවාර්ය වේ.)

4. යම් අයදුම්කරුවෙකුගේ උස/බර නියමිත පරිදි නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබාතිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. රාජ්‍ය භාෂා අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්/ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන්හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුද නියෝග අනුව ගුවන් හමුද නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුද (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුද පනතේ 10 වැනි වගන්තිය අනුව ''සෑම නිළධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක'' කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියකුට බලයක් නැති අතර, ගුවන් හමුද පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/

ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුද පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුද නිළධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිළධාරින්, නිළධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිළධාරින්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිළධාරින්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිළධාරින් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ඇ) (16) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදවේ අධිකාරිලත් නිළධාරින්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

| වසර<br>නිළය | 2017<br>(වාර්ෂිකව) | දීමනාවන් සකස්වීම 2017 (වාර්ෂිකව) | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 3,19,404.00 | 68,796.00 | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (නොවන ශිෂ්‍ය) | 3,46,764.00 | 64,476.00 | 5,02,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 3,93,684.00 | 56,580.00 | 5,71,380.00- (30 x 16,020) 10,51,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 4,59,996.00 | 45,996.00 | 6,67,500.00-(24 x 16,020) 10,51,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 5,04,204.00 | 38,940.00 | 7,31,580.00-(22 x 16,020) 10,84,020.00 |

(ආ) වෛද්‍ය නිළධාරින්ගේ වැටුප් :

| වසර<br>නිළය | 2017<br>(වාර්ෂිකව) | දීමනාවන් සකස්වීම 2017 (වාර්ෂිකව) | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 4,48,944.00 | 47,760.00 | 6,51,780.00 (3 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) |
| 2 වන ශ්‍රේණිය | 4,82,148.00 | 42,420.00 16x26,040) | 6,99,660.00 (3 x 16,020-7,16,140-2 x 19,560- |
| 1 වන ශ්‍රේණිය | 5,91,948.00 | 22,620.00 | 8,61,660.00 (3x16,020-7x16,140-2x19,560-16x26,040) |
| විශේෂ ශ්‍රේණිය | 7,27,608.00 | 2,808.00 | 1,056.000.00 (12 x 32,400) |

(ඇ) අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිළධාරින් සඳහා :

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 2,125.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 400.00 (මසකට) |

(3) විවේක කාල රාජකාරි බාටා

| | |
|---|---|
| ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව | - රු. 35,000.00 (මසකට) |

(4) අතිරේක රාජකාරි දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 335.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 383.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 528.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 628.00 (පැයකට) |

(5) භාෂා ප්‍රවීණතා දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,071.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,078.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 1,648.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 2,016.00 (පැයකට) |

(6) (15) (ඇ) ඡේදයේ දක්වෙන සේවා දීමනා අදළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

*(ඈ) අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු. 20.00ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව (1) මසකට රු. 3,100ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.)

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 16,676.14 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 537.94) පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිම රු. 637.50ක්) ගෙවනු ලැබේ.

(11) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(12) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(13) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(14) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයින්ට අදළ පරිදි)

(15) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(16) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින්ට පහත සඳහන් පරිදි කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා

(17) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(18) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි.)

(19) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි.)

(20) අමතර රාජකාරි ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි)

(21) දුරකථන බිල් දීමනාව
විශේෂඥ වෛද්‍ය නිළධාරි - රු. 8,000.00 (මසකට)
වෛද්‍ය නිළධාරි - රු. 4,000.00 (මසකට)

(22) ඉංජිනේරු දීමනාව මසකට රු. 15,000.00ක් (ඉංජිනේරු නිළධාරීන් සඳහා පමණයි)

(23) පශු වෛද්‍ය දීමනාව මසකට රු. 7,500 ක් (පශු වෛද්‍ය නිළධාරීන් සඳහා පමණයි.)

16. විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.—විටින් විට සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිළධාරීන් දායකයින් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව ය.

17. ඉල්ලුම්කරුවන්ට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2017 පෙබරවාරි මස 28 වැනි දින මධ්‍යහන 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ''………… ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික

(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික

(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික

* *සැළකිය යුතුයි.*-මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේදී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි වීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වේ.

19. තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට

සිදුවන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ කිසිවක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(*ඉ*) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම, එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(කේවීබී ජයම්පති,)
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෑ. 594
කොළඹ 02.

**ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාවේ . . . . . . . . . . ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :—————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ඉල්ලුම් කරන ශාඛාව :—————.

5. ඉල්ලුම් කරන තනතුර :—————.

6. ස්ථිර ලිපිනය :—————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

8. තැපැල් ලිපිනය :—————.

9. විද්‍යුත් ලිපිනය :—————.

10. උපන් දිනය :—————.

11. උස : අඩි :———— අඟල් :————.

12. දිස්ත්‍රික්කය :—————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම සේවක කොට්ඨාසය සහ අංකය :————.

15. දුරකථන අංකය :————.

16. විවාහක හෝ අවිවාහක බව :————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :————.

18. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ /විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෘත්තීය සුදුසුකම් :<br>වෙනත් : | | |

19. පාසලෙන් / විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැනට ලිපිනය* |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇග බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

02-700

---

**ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී. :-

1. (අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

(1) ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා)

(අ) ගුවන් යානා සැකිලි ශිල්පී
(ආ) ගුවන් යානා යන්ත්‍ර ශිල්පී
(ඇ) ගුවන් යානා විදුලි සහ මෙවලම් ශිල්පී
(ඈ) ආරක්ෂක උපකරණ ශිල්පී

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)

(අ) අවි ආයුධ ශිල්පී
(ආ) රථවාහන කාර්මික ශිල්පී
(ඇ) මතුපිට කාර්මික ශිල්පී
(ඈ) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(ඉ) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය/විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්

(අ) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි)
(ආ) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) ගුවන් විදුලි සංනිවේදක (පිරිමි)
(ඈ) දුරකථන ක්‍රියාකරු (පිරිමි/කාන්තා)
(ඉ) පරිඝනක කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) වෛද්‍ය වෘත්තීන් (පිරිමි/කාන්තා)

(අ) හෙද සහායක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ.) විභාගයෙන් විද්‍යා/ගණිත විෂය ධාරාවෙන් පහත දැක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහයක වෘත්තිය යටතේ) අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | |
|---|---|
| අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. උ. පෙළ ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යා විෂය ධාරාවන් යටතේ සාමාන්‍ය සාමාර්ථ 3ක් ලබා තිබීම. | - හෙද ඩිප්ලෝමාව (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. උ. පෙළ විද්‍යා විෂය ධාරාව හදුරා ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද රසායන විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ලබා තිබීම. | - ඖෂධවේදී රසායනාගාර කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා/ | - විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා) විද්‍යුත් නිකර්ෂණ රේඛන ශිල්පී (පිරිමි) |

අ. පො. ස. (උ. පෙළ.) රසායන විද්‍යාව
සහ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව
යන විෂයයන් සඳහා සාමාන්‍ය
සාමාර්ථයන්ද ජීව විද්‍යාව/සංයුක්ත
ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන්ද
සහිතව සමත්ව තිබීම.

අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා
සම්මාන සාමාර්ථයක් හා රසායන
විද්‍යාව, ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය - වෘත්තීය චිකිත්සක විකිරණ ශිල්පී භෞත චිකිත්සක අක්ෂි තාක්ෂණවේදී (පිරිමි)
යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද
භෞතික විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන්
ලබා තිබීම.

(*ආ*) දන්ත සහායක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විද්‍යා විෂයධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(5) පරිපාලන වෘත්තීන් (පිරිමි/කාන්තා)

(*අ*) පරිපාලන සහායක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ආ*) ගිණුම් සහායක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(6) මෙහෙයුම් වෘත්තීන්

(*අ*) මෙහෙයුම් ගුවන් (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(*ආ*) ගිනි නිවන්නා (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. බර වාහන රියදුරු බලපත්‍රයක් ලබාතිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ඇ*) මෙහෙයුම් භූමි (පිරිමි)
(*ඈ*) සුනඛ පාලක (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(7) සැපයුම් වෘත්තීන් ඃ

*(අ) සැපයුම් සහායක (පිරිමි/කාන්තා)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ආ) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) ගුවන් යානා කාර්ය මණ්ඩල සහායක (කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමේ හැකියාවක් තිබීම සහ ප්‍රියමනාප පෙනුමකින් යුක්ත වීම අනිවාර්ය වන අතර, ගුවන් සේවිකාවක ලෙස පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (ඇඟිලි තුඩුවලින් සිට ගත්විට සෙන්ටිමීටර් 212 ක උසක් දක්වා තම දැත් යොමු කළ හැකි විය යුතුය.)

(ආ) සලාක සහායක (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඇ) නිළ ඇඳුම් පරිස්කාරක (කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අධිවේගී මහන මැෂින් ක්‍රියා කරවීමේ හැකියාව (Overlock, Button Hole, Button Attached Double Needle, Bar Tack) ද, පතුරම් රහිතව මිමි අනුව මෝස්තර නිර්මාණය කිරීමේ හැකියාව, ඇඳුම් කැපීම සහ මහන මැෂින් පිළිබඳ කාර්මික දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(8) පොලිස් (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6ට නොඅඩු කාන්තා අයවළුන්හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(9) (අ) සංගීතඥ (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. වාදනය හා ගායනය පිළිබඳ මනා දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(10) ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි/කාන්තා) ඃ

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. මලල ක්‍රීඩාවලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින් සඳහා පුරප්පාඩු පවතී.**

2. (අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :-

(1) සැපයුම් වෘත්තීන්

(*ආ) භෝජනාගාර සහයක (පිරිමි/කාන්තා)*

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් අ. පො.ස. (සා පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ හැකියාවක් ඇති අයවළුන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙනු ලැබේ. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. (වැඩිදුර උසස් පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීමෙන් පසුව ප්‍රසිද්ධ හෝටල් ආශ්‍රයෙන් ලබාදෙනු ලැබේ.)

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදලව ඉඳුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

3. (අ) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :

(1.) පරිපාලන වෘත්තීන්

(අ) විගණන සහායක (නිත්‍ය - පිරිමි/කාන්තා)

(1) අ. පො. ස. (උ.පෙළ) වාණිජ විෂය ධාරාවෙන් හදරා ඉන් සමත්ව තිබිය යුතුයි.

(2) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ II අදියර (AAT Stage II) සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) දෙවන වසර සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව (HNDC) දෙවන වසර සමත් සහතිකයක් ලබා තිබීම.

(3) විගණනය පිළිබඳ රජයේ හෝ පුද්ගලික ආයතනයක පළපුරුද්ද ලබා ඇති අයවළුන් හට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් මත අදල නිළයේ පිහිටුවනු ලැබේ.

(2) **විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (නිත්‍ය - පිරිමි)**

(*අ*) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී,
(*ආ*) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී.

(1) සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(2) වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල්) පාඨමාලා සමත් සහතිකය තිබිය යුතුය.

* තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් මත නායක ගුවන්භට නිළයට බඳවාගනු ලැබේ.

(4) *අනෙකුත් සුදුසුකම්* : (අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි. :

(1) පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි;

(2) වයස : 2017 මැයි මස 20 වැනි දිනට
අවුරුදු 18ත් 23ත් අතර (නිත්‍ය පිරිමි)
අවුරුදු 18ත් 22ත් අතර (නිත්‍ය කාන්තා)
අවුරුදු 18ත් 30ත් අතර - භෝජනාගාර සහයක (ස්වේච්ඡා පිරිමි)
අවුරුදු 18ත් 25ත් අතර - භෝජනාගාර සහයක (ස්වේච්ඡා කාන්තා)

ඉඳුරාම බඳවාගැනීම්
අවුරුදු 18-26ත් අතර - විගණන සහායක (පිරිමි/කාන්තා)
අවුරුදු 18-28ත් අතර - ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී/විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී (පිරිමි)

(3) උස : අඩි 5යි අඟල් 5ට නොඅඩු විය යුතුයි; (පිරිමි)
අඩි 5යි අඟල් 3ට නොඅඩු විය යුතුයි; (කාන්තා)

(4) බර : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස}^2\ \text{(මී)}}$$

(5) වර්ණ දෘෂ්ටිය : සීපී2

(6) දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

(7) පපුව :- අඟල් 32ට නොඅඩු විය යුතුය. (පිරිමි)

(8) සිවිල් තත්ත්වය :

(අ) *නිත්‍ය ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන්* : අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළැඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(ආ) ස්වේච්ඡා, ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතු ය. මූලික පුහුණු පාඨමාලාව හදරා වසරක් ගතවීමෙන් පසුව විවාහවීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවට අවසර දෙනු ලැබේ.

(ඇ) ඉඳුරාම බඳවා ගැනීමේ දී ගුවන් භටයින් හෝ ගුවන් කාන්තාවන් ගුවන් හමුදවට බැඳී මූලික පුහුණු පාඨමාලාව නිමකරන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

5. පළමුවන ඡේදයෙහි ''අ'' සහ දෙවන ඡේදයෙහි ''අ'' සහ තුන්වන ඡේදයේ ''අ'' හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ හතරවන ඡේදයෙ හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. සේවා කොන්දේසි : අවිවාහක

(අ) ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුනුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(*ආ*) තෝරාගනු ලබන සියලුම ගුවන් භටයින්ට/ ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුය.

8. බඳවා ගැනීමේ කොන්දේසි :

(*අ*) නිත්‍ය ගුවන් භටයින්/නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා —

තෝරා ගනු ලබන අපේක්‍ෂකයින්/අපේක්‍ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්‍ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(*ආ*) ස්වේච්ඡා ගුවන් භටයින් ස්වේච්ඡා ගුවන් කාන්තාවන් සඳහා —

තෝරා ගනු ලබන අපේක්‍ෂකයින්/අපේක්‍ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට නිලයට/ ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

9. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.—* තෝරාගනු ලබන අපේක්ෂකයින් /අපේක්‍ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

10. වැටුප් හා දීමනා :

(*අ*) වත්මන් නව මූලික වැටුප් සංශෝධනය අනුව 2020 දක්වා වසරකට ගුවන් භටයින්ට අදාළ මූලික වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ. :-

| වර්ෂය<br>නිලය | 2016<br>(වාර්ෂිකව) | 2017<br>(වාර්ෂිකව) | 2018<br>(වාර්ෂිකව) | 2019<br>(වාර්ෂිකව | 2020<br>(වාර්ෂිකව) |
|---|---|---|---|---|---|
| ගුවන්භට | 2,07,984.00 | 2,44,608.00 | 2,81,232.00 | 3,17,856.00 | 3,54,480.00 (7x300-19x370) |
| නායක ගුවන්භට | 2,14,320.00 | 2,52,060.00 | 2,89,800.00 | 3,27,540.00 | 3,65,280.00 (4x300-19x370) |
| කෝප්‍රල් | 2,20,656.00 | 2,59,512.00 | 2,98,368.00 | 3,37,224.00 | 3,76,080.00 (1x300-10x370-9x495) |
| සැරයන් | 2,27,808.00 | 2,67,996.00 | 3,08,184.00 | 3,48,372.00 | 3,88,560.00 (3x370-9x495-3x660) |
| බලපත්‍ර සැරයන් | 2,32,848.00 | 2,73,996.00 | 3,15,144.00 | 3,56,292.00 | 3,97,440.00 (1x370-9x495-3x660) |
| බලලත් නිලධාරීන් | 2,42,352.00 | 2,85,204.00 | 3,28,056.00 | 3,70,908.00 | 4,13,760.00 (7x495-14x660) |
| ප්‍රධාන බලලත් නිලධාරීන් | 2,71,452.00 | 3,19,404.00 | 3,67,356.00 | 4,15,308.00 | 4,63,260.00 (13x660) |

(*ආ*) *දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) දිරි දීමනා මසකට රු. 250.00 බැගින් සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා දිනකට රු. 20.00 ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු. 3,880.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව I : මසකට රු. 2,400.00 ක් ගෙවනු ලැබේ. (රාජකාරී දිනකට රු. 80 බැගින්)

(6) අන්තර් දීමනාව : මසකට රු. 1000.00 ක් ගෙවනු ලැබේ.

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.-මසකට රු. 170.00 ක් ගෙවනු ලැබේ.

(8) *ආහාර දීමනා.*-පිටත වාසය කරන ගුවන් භටයින්ට මසකට රු. 14,213.70 බැගින් ගෙවනු ලැබේ. (කඳවුරු තුළ වාසය කරන ගුවන්භටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(9) *සුදුසුකම් වැටුප්* : ගුවන් හමුදවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම 637.50)

(10) *ගමනාගමනය.*-වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් භටයා/භාර්‍යාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(11) *වෛද්‍ය පහසුකම්.*-ගුවන් හමුදාව මඟින් සෑම ගුවන් භටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර, විවාහකනම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(12) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් භටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මඟින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(13) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවකටම මසකට සැරයන් නිලයේ සිට පහළට රු. 1,200 සිට රු. 2750 දක්වා ද, බලපන්ති සැරයන් නිලයේ සිට ඉහළට රු. 1350.00 සිට රු. 3300.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(14) *නේවාසික පහසුකම්* : කඳවුර තුළ වාසය කරන ගුවන් භටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(15) *වික්ෂේපණ දීමනා.*-මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(16) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.*-මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ට ය. (මසකට රු. 30 සිට රු. 511.50 දක්වා)

(17) *නැවත සේවයට බැඳීමේ වැටුප්.*-නැවත සේවයට බැඳෙන ගුවන් භටයන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(18) *උපදේශක දීමනාව.*-මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමිවේ.

(19) *වෙනත් දීමනා.*-(වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(20) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් භටයින්/ගුවන් කාන්තාවකටම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

11. ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස් :

(*අ*) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2017 පෙබරවාරි මස 28 වන දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, ඒකළ, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ.) අයදුම්පතේ ඉහල වම් කෙලවරේ ''ශ්‍රී ලංකා ගුවන් හමුදවේ නිත්‍ය/ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් කලයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කලයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකළ, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත්, ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. තව ද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂක විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

12. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුද බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

13. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

14. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුද වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

15. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේ ය.

16. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

17. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

(කේවීබී ජයම්පති)
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594.
කොළඹ,

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම :—————.
(ජාතික හැඳුනුම්පතට අනුව)

2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :—————.

4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :—————.

5. ස්ථිර ලිපිනය :—————.

6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර :—————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

8. දිස්ත්‍රික්කය:—————.

9. මැතිවරණ කොට්ඨාසය :—————.

10. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

11. දුරකථන අංකය :—————.

12. උපන් දිනය :—————.

13. වයස (2017 මැයි මස 20 වැනි දිනට) : අවුරුදු :———. මාස :———. දින :———.

14. විවාහක/අවිවාහක බව :—————.

15. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

16. උස : අඩි :—————. අඟල් :—————.

17. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත් වූ විෂයයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

18. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

| *අවුරුද්ද* | *විභාග අංකය* | *සමත් වූ විෂයයන්* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.

20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ඨතා පිළිබඳ විස්තර :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

24. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

25. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :————.

02-701

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිවැරදි කිරීමයි

### ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

2017 ජනවාරි මස 27 වැනි සිකුරාද අංක 2004 දරන *ගැසට් පත්‍රයේ* (i) කොටස (ii) (අ) ඡේදය - විභාග, විභාග ප්‍රතිඵල ආදිය හි 01-838 සඳහන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2017 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධ නිවේදනයේ උසස් ජාතික පාරිභෝගික විද්‍යාව හා නිපයුම් තාක්ෂණ ඩිප්ලෝමාව සම්බන්ධ සපුරා ලිය යුතු සුදුසුකම්වල පහත ආකාරයට නිවැරදි විය යුතුයි.

5. උසස් ජාතික පාරිභෝගික විද්‍යාව හා නිපයුම් තාක්ෂණ ඩිප්ලෝමා - උ. ජා. පා. වි. නි. තා. ඩි. - (පූර්ණ කාලින) - කාලය වසර 2 1/2 යි.

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරකදී ගෘහ ආර්ථික විද්‍යාව විෂයය ද ඇතුළත්ව සියලුම විෂයයන්ගෙන් සමත්වීම.

සහ

(ii) අ. පො. ස. (ස/පෙළ) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

02-852

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සමාජ සේවා දෙපාර්තමේන්තුව

**සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ස්ථාන භාර නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය - 2017**

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ස්ථාන භාර නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් තෝරා ගැනීමට, සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන්, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2017 මැයි මස කොළඹ දී පැවැත්වීමට නියමිත තරග විභාගය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් සුදුසුකම්ලත් සමාජ සේවා නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පත් කරනු ලබන නිලධාරි සංඛ්‍යාව 04 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

02. සේවා කොන්දේසි :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/4/1 හා 2012. 06. 22 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පංතිය නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 හා 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් ස්ථානභාර නිලධාරි තනතුරට පත්කරනු ලැබේ.

2.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත, වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

2.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 5ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

03. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව එම්. එන්. 7-2016 වැටුප් ඛණ්ඩයෙහි 06 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

වැටුප් පරිමාණය :- MN 7-2016 : රු. 45,355-11x755-18x 1030-රු. 68,425.

04. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(*අ*) (i) ශ්‍රී ලංකා පුරවැසියකු වීම,
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම,
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රධානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් තිබීම;

*සහ*

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරි තනතුරේ ස්ථිර කළ එම තනතුරේ පස් (05) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

*හෝ*

(ii) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරි තනතුරේ ස්ථිර කළ එම තනතුරේ දස (10) අවුරුදු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

*සටහන* :

සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම් :

(i) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2017.03.20 දිනට සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.
(ii) පූර්වාසන්න අවුරුදු 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම.
(iii) පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයා තිබීම.

05. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, කඩදසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදසියක, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2:11 තෙක් පළමු පිටුවට ද, 3.0 සිට 4.0 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද / යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව

පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(*ආ*) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. අයදුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) I. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2017.03.20 වැනි දිනට පෙර යැවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව, ''සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ස්ථානභාර නිලධාරි තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2017'' යනුවෙන් සඳහන් කර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

II. විභාග ගාස්තු රු. 1,200.00 කි. විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදු පත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

(*ඈ*) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම් කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පල කරනු ඇත. නිවේදනය පල වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

06. *විභාගයට ඇතුළුවීම* :

(*අ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් හට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකුට තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පල කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය කරන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

09. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

10. විභාග ක්‍රමය හා විභාග මාධ්‍ය.

(අ) විභාගය සිංහල, දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ,

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය;

(ඇ) අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

11. බඳවා ගැනීමේ ක්‍රමය :

*ලිඛිත විභාගය* : (ස්ථාන භාර නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය) වැඩ හා පිරිස් කළමනාකරණය පිළිබඳ වූ සිද්ධි අධ්‍යයනය පිළිබඳ ලකුණු 100 ක පැය 03 ක රචනා හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. සාමාර්ථය සඳහා ලකුණු 40% කට නොඅඩුව ලබාගත යුතු ය.

වැඩ පිරිස් කළමනාකරණය පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය හා දැනුම තක්සේරු කරනු සඳහා ආයතන පරිපාලනය, කළමනාකරණය, ගැටලුවලට මුහුණදීම හා එම ගැටලු විසඳීම, ආයතනික ඵලදාව හා කාර්යක්ෂමතාව වැඩි කිරීම ආදී වැඩ හා පිරිස් කළමනාකරණයට අදාළ සිද්ධියක් හෝ සිද්ධීන් කිහිපයක් ඇසුරෙන් සකස් කරනු ලබන රචනා හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ.

සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ලකුණු 40% ක නොඅඩුව ලබාගත් නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් යටතේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා එම ලිඛිත විභාගයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු කුසලතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් තෝරාගනු ලැබේ.

***ස්ථානභාර නිලධාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය***

01. ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර

| | *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් (බඳවා ගැනීම් නිවේදනයේ අංක 04 යටතේ සඳහන් මූලික සුදුසුකම්වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු හිමි වේ.) | | 10 |
| 1. | පශ්චාත් උපාධිය (සමාජ විද්‍යාව/පරිපාලනය/කළමනාකරණ සම්බන්ධව) | 10 | |
| 2. | පළමු පන්තියේ උපාධි සාමාර්ථ්‍ය | 08 | |
| 3. | පංති සාමාර්ථ්‍ය සහිත උපාධිය සඳහා (මෙහිදී යම් විෂයයන් පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගවල දී නිදහස් කර ඇත්නම් ඔවුන්ට නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.) | 06 | |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම් | | |
| | තනතුරට අදාළ ක්ෂේත්‍රයේ | | 15 |
| 1. | පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පත්වීම් බලධරයා විසින් පිළිගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගන්නා ලද වසරකට නොඅඩු සමාජ වැඩ/පරිපාලනය උපදේශනය/කළමනාකරණය යන විෂයයන්ට ඩිප්ලෝමාවක් ලබා තිබීම | 15 | |
| 2. | පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පත්වීම් බලධරයා විසින් පිළිගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගන්නා ලද මාස 06ට නොඅඩු සමාජ විද්‍යාව විෂයය/ පරිපාලන/කළමනාකරණය යන විෂයයන්ට අදාළ සහතිකයක් ලබා තිබීම (සංඥා භාෂා ඩිප්ලෝමාව, බ්‍රේල් ඩිප්ලෝමාව) | 10 | |
| 3. | පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පත්වීම් බලධරයා විසින් පිළිගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගන්නා ලද මාස 03ට නොඅඩු සමාජ විද්‍යාව විෂයය ක්ෂේත්‍රය / පරිපාලනය / කළමනාකරණය යන විෂයයන්ට අදාළ සහතිකයක් ලබා තිබීම. | 05 | |
| 03. | අතිරේක පළපුරුද්ද (මූලික සුදුසුකම් ලෙස සලකා බලන වසර 5 ක් හෝ 10 ක් ඉක්ම වූ වසරක් සඳහා) | | 40 |
| I. | II ශ්‍රේණියේ තනතුරේ එක් අවුරුද්දක් සඳහා | 03 | |
| II. | I ශ්‍රේණියේ තනතුරේ එක් අවුරුද්දක් සඳහා | 05 | |
| 04. | පරිගණක හැකියාව (උපරිම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමේ.) | | |
| 1. | පත්වීම් බලධාරියා විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ වසරක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා | 05 | |
| 2. | පත්වීම් බලධාරියා විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ මාස 6 ක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක් / සහතිකයක් සඳහා | 03 | |

| | *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 05. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය<br><br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු හිමිවේ.) | | |
| | 1. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රථම උපාධිය/පශ්චාත් උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදරා තිබීම/ඉංග්‍රීසි භාෂාව උපාධියේ විෂයයක් වශයෙන් සමත්වීම/අ.පො.ස. (උ/පෙළ) ඉංග්‍රීසි විෂයක් ලෙස සමත් වීම. | - 05 | 05 |
| | 2. පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසරක හෝ ඊට වැඩි ඩිප්ලෝමාවක් / සහතිකයක් හෝ අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි විෂයට විශිෂ්ට සාමාර්ථයක් ලබා තිබීම. | - 03 | |
| | 3. පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06 ක හෝ ඊට වැඩි ඩිප්ලෝමාවක් / සහතිකයක් හෝ අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි විෂයට සම්මාන සමාර්ථයක් ලබා තිබීම. | - 02 | |
| | 4. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | - 01 | |
| 06. | වෘත්තීය ක්ෂේත්‍රයේ සිදුකර ඇති විශේෂ ක්‍රියාකාරකම්/වැඩ සටහන්/ව්‍යාපෘති සඳහා<br><br>(දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර තිබිය යුතුය) | | 20 |
| | 1. ආබාධිත ප්‍රජාව වෙනුවෙන් කරන ලද නිර්මාණශීලි ක්‍රියාකාරකම් (ජාතික මට්ටම දක්වා වර්ධනය වූ ප්‍රාදේශීය මට්ටමින් ආරම්භ වූ ක්‍රියාකාරකම්) | - 05 | |
| | 2. ස්වශක්ති කණ්ඩායම්/ස්වේච්ඡා නියෝජිතයින් ඇසුරෙන් ප්‍රජා මූලිකත්වයෙන්/සාර්ථක ක්‍රියාකාරකම්. | - 05 | |
| | 3. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් ආබාධිත හෝ විෂය පථයට අදාළව ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇති ජාතික/ජාත්‍යන්තර ජයග්‍රහණ දක්වා වූ ව්‍යාපෘති | - 05 | |
| | 4. ප්‍රතිලාභීන් සඳහා සවිබලගැන්වීම් සඳහා දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මගින් ලබා දී ඇති ප්‍රතිලාභ හා ප්‍රතිපාදන වලට අමතරව නිර්මාණශීලීව කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන් | - 05 | |
| | 5. වෙනත් විශේෂ ක්‍රියාකාරකම් / වැඩසටහන් | - 05 | |
| 07. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |

ප්‍රතිඵල නිකුත් කිරීම :

ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබාදෙනු ඇත. කොමිසමේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.exams.results.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ඇත.

(12) සැලකිය යුතුයි :
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

(13) ''සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ''.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

මහින්ද සෙනෙවිරත්න,
ලේකම්,
සමාජ සවිබලගැන්වීම් හා
සුභසාධන අමාත්‍යාංශය

2017 පෙබරවාරි මස 06 වැනි දින,
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය,
1 වන මහල,
ii අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ස්ථාන භාර නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය - 2017

## Limited Competitive Examination for Recruitment to Officer-in - Charge in Vocational Training Centers under Department of Social Services - 2017

| | | | |
|---|---|---|---|
| 1.0 | මාධ්‍ය<br><br>සිංහල - 2 දෙමළ - 3 | ☐ | (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි) |

2.0 පෞද්ගලික තොරතුරු :
2.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(*උදා.* HERATH MUDIYANSELAGE
SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම
(*උදා.* (GUNAWARDHANA, H.M.S.K.) :————.

2.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 කාර්යාලයීය ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.8 විවාහක / අවිවාහක බව :
අවිවාහක - 1 විවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.9 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ -3, මුස්ලිම් - 4, වෙනත් - 5) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.10 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.11 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.0 (i) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :

ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් උපාධිය සහිත ද / රහිත ද
යන වග :————.
උපාධිය ලද දිනය :————.
විශ්ව විද්‍යාල / ආයතනය :————.
ලියාපදිංචි අංකය :————.
බාහිර / අභ්‍යන්තර :————.
විෂයයන් :————.
පන්තිය :————.
ඉහළ / පහළ :————.
උපාධිය වලංගු දිනය :————.
විභාගය පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 සේවා පළපුරුද්ද :

i සමාජ සේවා නිලධාරි තනතුරට පත් වූ දිනය :————.
ii ස්ථිර කළ දිනය :————.
iii දැනට සිටින ශ්‍රේණිය :————.
iv එම ශ්‍රේණියට පත් වූ/උසස් වූ දිනය :————.
v. 2017.03.20 දිනට සමාජ සේවා නිලධාරි I/II ශ්‍රේණියේ සේවා කාලය :————.

මුදල් ගෙවූ කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න :

☐

5.0 අයදුම්කරුගේ ප්‍රකාශය :

............................ දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 04 ආ ඡේදයට අනුව ............... දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම අකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් බවද ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

6.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන....................... මයා./මිය./මෙනෙවිය සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරි තනතුරේ සේවය කරන බව ද, ............ දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ ඔහුගේ / ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට / (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල අඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට්* නිවේදනයේ 04 ආ ඡේදයට අනුව අවුරුදු .......... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදල *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

02-696

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිණී තනතුරු**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්ෂක කෙඩෙට් නිළධාරී/නිළධාරිණී තනතුරු සඳහා 2017 පෙබරවාරි මස 12 වැනි දින සිට 2017 මාර්තු මස 11 වැනි දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත්වන කෙඩෙට් නිලධාරී/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හිදී පහත පාඨමාලාවන් පැවැත්වේ.

(i) වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය අවුරුදු පහ (අවු. 5) ක් ද,
(ii) විද්‍යාවේදී (බී. එස්. සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(iii) නීතිවේදී (එල්. එල්. බී.) උපාධිය අවුරුදු හතර (අවු. 4) ක් ද,
(iv) විද්‍යාවේදී (බී. එස්. සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(v) විද්‍යාවේදී (බී. එස්. සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාය හය (අවු. 4 1/2) ක් ද,
(vi) විද්‍යාවේදී (බී. එස්. සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(vii) විද්‍යාවේදී (බී. එස්. සී.) හට කාර්ය කළමනාකරණ උපාධිය අවුරුදු තුන (අවු. 3) ක් ද,
(viii) විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය අවුරුදු තුන (අවු. 3) ක් ද,
(ix) විද්‍යාවේදී (බී. එස්. සී.) සමාජ විද්‍යා උපාධිය අවුරුදු තුන (අවු. 3) ක් ද වේ.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සූරියවැව දක්ෂිණ මණ්ඩපය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

(x) වාස්තු විද්‍යාවේදී උපාධිය අවුරුදු පහයි මාස හය (අවු. 5 1/2) ක් ද,
(xi) විද්‍යාවේදී (බී. එස්. සී.) නිර්මිත පරිසරය (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(xii) විද්‍යාවේදී (බී. එස්. සී.) නිර්මිත පරිසරය උපාධිය අවුරුදු තුනයි මාස හය (අවු. 3 1/2) ක් ද,
(xiii) විද්‍යාවේදී (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(xiv) විද්‍යාවේදී (බී. එස්. සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2)ක් ද,
(xv) විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,
(xvi) විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු. 4 1/2) ක් ද,

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරින් හා නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවල දී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොටගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරින්/නිලධාරිණියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහා පත් කරනු ලැබේ.

3.2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට :

* වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී) ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
* නීතිවේදී (එල්. එල්. බී,) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) හටකාර්ය කළමනාකරණ උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස් සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස් සී) සමාජ විද්‍යා උපාධිය; හෝ
* වාස්තු විද්‍යාවේදී උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) නිර්මිත පරිසරය (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) නිර්මිත පරිසරය උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස් සී) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස් සී) තොරතුරු තාක්ෂණ (ගෞරව) උපාධිය; හෝ
* විද්‍යාවේදී (බී. එස්. සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය හෝ පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතු ය.

(i). වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධි පාඨමාලාව.-කාලසීමාව අවුරුදු පහකි (අවු.05). (කෙඩෙට් නිලධාරී)

**2016 වර්ෂයේ අ. පො. ස. (උ./පෙළ)** විභාගයෙන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ii) විද්‍යාවේදී (බී. එස්. සී.) ගගන/ගුවන්යානා නඩත්තු /ජීව වෛද්‍ය/සිවිල්/විදුලි හා විද්‍යුත්/විද්‍යුත් හා විදුලි සංදේශ/නාවික/යාන්ත්‍රික/මෙකාට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලා. කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි (අවු. 4 1/2) (කෙඩෙට් නිළධාරී).

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ./පෙළ) විභාගයෙන් ගණිත විෂයය ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(iii) නීතිවේදී (එල්. එල්. බී.) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරකි. (අවු. 4) (කෙඩෙට් නිලධාරිනි)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය තුනක් (03) ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාරඅධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| | ගණිතය /සංයුක්ත ගණිතය | |
| භෞතික විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | | |

හෝ

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයකට (01) හෝ දෙකකට (02) අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය දෙකක් (02) සහ අනෙක් විෂය හෝ විෂයයන් පහත ලැයිස්තුවෙන් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය | දෙමළ | චීන |
| ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ලතින් | අරාබි |
| හින්දු ධර්මය/හින්දු ශිෂ්ටාචාරය | ප්‍රංශ | පාලි |
| ග්‍රීක/ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සිංහල | ඉංග්‍රීසි (විෂයය අංක 73 |
| ඉස්ලාම්/ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් | |
| සංස්කෘත | ජර්මන් | |
| කෘෂි තාක්ෂණය | නාට්‍ය හා රංග කලාව | |

(iv) විද්‍යාවේදී (බී. එස්. සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු. 4 1/2) (කෙඩෙට් නිලධාරී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ගණිත විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයක්-
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(v) විද්‍යාවේදී (බී. එස්. සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු. 4 1/2) (කෙඩෙට් නිලධාරී)

2016හෝ 2015 වර්ෂයේදී අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී ගණිත විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයයක්-
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(vi) විද්‍යාවේදී (බී. එස්. සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු. 4 1/2) (කෙඩෙට් නිලධාරී)

2016හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ගණිත විෂය ධාරාව යටතේ සංයුක්ත

ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(vii) *විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව* .- කාලසීමාව අවුරුදු තුනකි. (අවු. 3) (කෙඩෙට් නිලධාරි)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව යන විෂයයන් හදරා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍ය තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(viii) *විද්‍යාවේදී (බී. එස්. සී.) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව* .- කාලසීමාව අවුරුදු තුනකි. (අවු. 3) (කෙඩෙට් නිලධාරි/නිලධාරිනි)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස (උ/පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ix) *විද්‍යාවේදී (බී. එස්. සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව.*- කාලසීමාව අවුරුදු තුනකි. (අවු. 3) (කෙඩෙට් නිලධාරී/නිලධාරිනී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(x) *වාස්තුවිද්‍යාවේදී උපාධිය.*-කාලසීමාව අවුරුදු පහයි මාස හයකි. (අවු. 05 1/2) (කෙඩෙට් නිලධාරි)

විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු. 04 1/2) (කෙඩෙට් නිලධාරි)

*විද්‍යාවේදී (බී. එස්. සී.) (නිර්මිත පරිසරය) උපාධි පාඨමාලාව.*-කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවු. 03 1/2) (කෙඩෙට් නිලධාරි)

2016 හෝ 2015 වර්ෂයේ දි අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

(i) අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක්

ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

සහ

(ii) පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක්

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂිවිද්‍යාව |

සහ

(iii) අවම වශයෙන් අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය I හෝ II විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සමාර්ථ්‍යයක් ලබා තිබීම.;

සහ

(iv) කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් පවත්වන අවකාශීය ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(vii) *විද්‍යාවේදී (බී. එස්. සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව.*-කාල සීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු. 04 1/2) (කෙඩෙට් නිලධාරී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයකට ද,

සංයුක්ත ගණිතය/උසස් ගණිතය ;

*සහ*

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය/ විෂයයන්ට ද පෙනී සිටිය යුතු ය.

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යයනය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය | | |

ඊට අමතරව, අපේක්‍ෂකයන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරා තිබිය යුතු ය.

(*අ*) ගණිතය I හෝ II විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක්;

(*ආ*) විද්‍යා I හෝ II විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්.

(viii) විද්‍යාවේදී (බී. එස්. සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු 04 1/2) (කෙඩෙට් නිළධාරී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ/පෙළ) විභාගයේ ගණිත විෂය ධාරාව හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(ix) විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු තාක්‍ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි. මාස හයකි.
(අවු. 4 1/2) (කෙඩෙට් නිළධාරී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

(x) විද්‍යාවේදී (බී. එස්. සී) තොරතුරු පද්ධති (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි. මාස හයකි.
(අවු. 4 1/2) (කෙඩෙට් නිළධාරී)

2016 හෝ 2015 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂය ධාරාව, ගණිත විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව යන විෂය ධාරාවන් අතුරින් එක් විෂය ධාරාවක් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා,

3.5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාළ වන පරිදි ඉංග්‍රීසි, කළමනාකරණය, තොරතුරු තාක්‍ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන් ද අනිවාර්යයෙන් ම හැදෑරිය යුතු ය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතු ය.

04. කෙඩෙට් නිළධාරී/නිළධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :

අයදුම්කරු.—

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(*ආ*) 2017 මාර්තු 11 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතු යි.

*අධ්‍යාපන සුදුසුකම්* :

(*ඇ*) අ. පො. ස. (උ/පෙළ) විභාගයෙන් අදාළ විෂය ධාරාවෙන්, විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යය 3ක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සළකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබීම ;

*සහ*

(i) සාමාන්‍ය පොදු පරීක්‍ෂණයෙන් සමත්වීම;
(ii) සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

(*ඈ*) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතු ය.

| | | පිරිමි | කාන්තා |
|---|---|---|---|
| උස : | යුද හමුදාව | 5' 6" | 5' 3" |
| | නාවික හමුදාව | 5' 6" | 5' 3" |
| | ගුවන් හමුදාව | 5' 6" | 5' 4" |
| බර : | යුද හමුදාව | කිලෝ ග්‍රෑම් 50 | — |
| | නාවික හමුදාව | කිලෝ ග්‍රෑම් 52 | කිලෝ 41 |
| | ගුවන් හමුදාව | 17<BMI<25 | 17<BMI<25 |
| පපුව : | | 32" (ප්‍රශ්වාස) | — |

සටහන.—ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන් හි ජාතික මට්ටමේ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තව ද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර, අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

(සෞඛ්‍ය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්ව විද්‍යාල වෙබ් අඩවියෙන් ලබාගත හැක මෙම විශ්ව විද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk)

(ඊ) අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිළධාරියෙකුට/නිළධාරිනියකට පුහුණුවීම් කාලය තුළ දී විවාහ වීමට අවසර නොමැති අතර, සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. *සේවා කොන්දේසි.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන හෝ සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ට ද අනුකූලව විශ්වවිද්‍යාලය මගින් කලින් කලට පනවන ලද්දා වූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 12කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතු වේ.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළවන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/නිලධාරිනියකට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 38,000 ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද නොමිලේ සපයනු ලැබේ.

(i) ආහාර හා නවාතැන්
(ii) නිළ ඇඳුම්
(iii) අනුගාමික සේවාවන්
(iv) ක්‍රීඩා හා විනෝද පහසුකම්
(v) වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

(*අ*) පහත සඳහන් මාසික දීමනාවන් ද ගෙවනු ලැබේ :–
(i) සුදුසුකම් දීමනා;
(ii) ආහාර දීමනාව;
(iii) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක්;
(විවාහක නිළධාරීන්ට පමණක්)
(iv) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

(*ආ*) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

(i) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්;
(ii) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී;
(iii) නිල ඇඳුම් දීමනා;
(iv) විවාහක නිළධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය;

9. ශ්‍රී ලංකා යුද, නාවික සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

(*අ*) යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය;
(*ආ*) යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන වලංගු රෙගුලාසි;
(*ඇ*) ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළකරන වලංගු යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය.

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක කෙඩෙට් නිළධාරීන්/නිළධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිළධාරීන්/නිළධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12 පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන්, ඔවුන් සඳහා වෙන්කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13 *භාෂා අවශ්‍යතා.* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේ දී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.*-අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. *අයදුම්පත්.*—මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේ දී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් දහසක (රු. 1,000) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුවේ "මොරටුව – ඉඩම" ශාඛාවේ අංක "9405831" ගිණුමට බැරකර, ඔබ වෙත ලැබෙන **ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.** අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේ දී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදුකරනු ලබන අතර, එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 2017 මාර්තු මස 11 වැනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන උපාධි පාඨමාලාව සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිළධාරීන්ගේ/ නිළධාරිනියන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතු ය.

19. උප්පැන්න සහතිකය, අ. පො. ස. (සා./පෙළ), අ. පො. ස. (උ./පෙළ) විභාග සඳහා ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් යන ලේඛනවල පිටපත් **පමණක්** අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

21. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. **අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.**

23. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

24. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජිනේරු, කරුණාසේන හෙට්ටිආරච්චි,
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක
විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලයේ සභාපති.

02-883

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016) II අදියර

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුර-වැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ ''ලේකම්'' යනුවෙන් අදහස් කරනුයේ ''රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්'' වේ. ''සේවය'' යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂීකොට සඳහන් කර නොමැති අවස්ථාවන්හි දී ''ශ්‍රී ලංකා පරිපාලන සේවය'' වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2017 මාර්තු මස 20 වන දින වේ.

*සටහන* : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

ලිඛිත විභාගය : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර පහ (05) කින් සමන්විත වේ.

I. සාමාන්‍ය බුද්ධිය
II. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා
III. ගෝලීය ප්‍රවණතා
IV. කළමනාකරණමය අභියෝගතාව
V. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා

*විභාග දිනය.*-මෙම විභාගය 2017 මැයි මස කොළඹ, ගම්පහ සහ කළුතර යන නගරවලදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය.*-ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව 175 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි* :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. *මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895/- (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ 11 හි

සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(*අ*) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම,
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම,
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

*සටහන* : උපාධිය බලපවත්නා දිනය සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

(*ඇ*) වයස :
අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු විසි අට (28) ට නොවැඩි විය යුතු ය.

(*ඈ*) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

විවෘත තරග විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්රුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදළ කර ගනු නොලැබේ.)

(i) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

7. *විභාග ගාස්තු* :- විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පළමුව දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. මුදල් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ අදළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක්ම සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 81/2" x 12" (ඒ4) ප්‍රමාණයේ කඩදසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිට අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ අයදුම්පත් කඩදසියේ පළමුවැනි පිටුවේද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවේද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.

(*ඇ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2017 මාර්තු මස 20 වන දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව ''ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015 (2016) 11 අදියර'' යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාග යේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන

නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළුවීම :-

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන*.-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :-
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන්, භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකින් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6(ආ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම අයදුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය :

14.1 ලිඛිත විභාගය

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර පහ (05) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදිවේ.

| | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා | 100 | 50 |
| 3 | ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 4 | කළමනාකරණමය අභියෝගතාව | 100 | 50 |
| 5 | නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | 100 | 50 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2. සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(i) සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්තවේ.

*(අ)* සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

*(ආ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ, මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| | *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතාව | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂය | 05 |
| | එකතුව | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව සහ අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iv) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙලින් සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සැලකිය යුතුයි :-
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results, exams. gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-

(01) සාමාන්‍ය බුද්ධිය

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළැඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කරේ.

(කාලය පැය 1 1/2 යි. ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා ‡

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්වයන් හා අදළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(03) ගෝලීය ප්‍රවණතා

ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

(04) කළමනාකරණමය අභියෝගතාව

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනා දී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය)

(05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා

දෙන ලද මාතෘකාවන්/ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/ තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය)

16. සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 03 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (2016) II අදියර
Open Competitive Examination for Recruitment to Grade III of
Sri Lanka Administrative Service - 2015 (2016) Stage II

1.0

1.1 මාධ්‍යය :-

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.2 විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය :-

කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3

| නගරය | නගර අංකය |
|---|---|
| | |

( අදාළ නගරය හා නගර අංකය කොටුව තුළ ලියන්න.
නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) : ——— .
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම : ——— .
(උදා: GUNAWARHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ——— .

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) :- (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) : ——— .

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ——— .

2.6 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

2.7 විවාහක/ අවිවාහක බව : අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

2.8 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.9 ජාතික හැඳුනුම්පත් අංකය :

2.10 උපන් දිනය : වර්ෂය මාසය දිනය

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2017.03.20 දිනට වයස :- අවුරුදු මාස දින

2.12 දුරකථන අංකය :-

3.0 (i) උපාධිය ලද දිනය : ——— .
(ii) විශ්ව විද්‍යාලය / ආයතනය : ——— .

(iii) ලියාපදිංචි අංකය : ————— .
(iv) බාහිර/ අභ්‍යන්තර : ————— .
(v) උපාධිය : ————— .
(vi) විෂයයන් : ————— .
(vii) පන්තිය : ————— .
ඉහළ/පහළ : ————— .
(viii) උපාධිය වලංගු දිනය : ————— .
(ix) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය : ————— .

4.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වූ මීට පෙර පැවැත් වූ විභාගයන්ට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න.

| 2013 දෙසැම්බර් මස 23 වැනි දින අංක 1842/2 අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව (දැනට ක්‍රියාත්මක) 2012.07.01 වැනි දිනට පසු පෙනී සිටි වර්ෂයන් | විභාගය | පෙනී සිටි/නොසිටි බව |
|---|---|---|
| | 2013 (2015) විවෘත | |
| | 2014 (2016) විවෘත | |

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

*ලදුපත නොගැලවෙන ලෙස එහි එක් දරයකින් මෙහි අලවන්න.*
*(ලදුපතේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

6.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .............. හා ....................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගව පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නිතී රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.............................
දිනය ඃ....................... අයදුම්කරුගේ අත්සන.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතුය.) :-

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන.................................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, .................. දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

.............................
දිනය ඃ................. (අත්සන)

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ————— .
තනතුර : ————— .
ලිපිනය : ————— .
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය :- (රාජ්‍ය/පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................. මහතා / මහත්මිය / මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .................................................. ලෙස සේවය කරන අතර, ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

...........................
දිනය :- .................. (ආයතන ප්‍රධානියාගේ අත්සන)
නම :- ..................
තනතුර :- .............................................
(නිලමුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

02-752

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016) II අදියර

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ :

(අ)''ලේකම්'' යනුවෙන් අදහස් කරනුයේ ''රාජ්‍ය පරිපාලන සහ කළමණාකරන අමාත්‍යාංශයේ ලේකම්'' වේ.

(ආ)''සේවය'' යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවය'' වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගය :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ.

(i) සාමාන්‍ය බුද්ධිය
(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවනතා
(iii) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයන I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)
(iv) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව).

***විභාග දිනය*** :-මෙම විභාගය ***2017 මැයි*** මස කොළඹ නගරය තුළ දී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

***සම්මුඛ පරීක්ෂණය*** :-ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුලු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව **46** කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටියක රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

4. සේවා කොන්දේසි :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමය-න් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු, /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. මාසික වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ 11 හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිළධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :*

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රධානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සහ

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි වැටුප් කේත අංක එම්. එන්. 2-2016 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල් 1-2016 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

හෝ

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක එම් එන් 2-2016 හෝ ඉහල එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල් 1-2016 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

සටහන :

1. උපාධිය බලපවත්නා දිනය 2016.07.01 වැනි දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.
2. ඉහත සඳහන් කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය සේවය සහ/හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

(ඇ) වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම් :

(i) 2016.07.01 වැනි දිනට වයස් සීමාව අවුරුදු පනස් තුන (53)ට නොවැඩි විය යුතු ය,
(ii) ඉහත 6(ආ) හි සඳහන් සේවයක/තනතුරක ස්ථිරත්වය ලබා තිබීම,
(iii) පූර්වාසන්න අවුරුදු 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම,
(iv) පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.

(ඈ) *සුදුසුකම් පිළිබඳ සීමාවන් :*

(i) සීමිත තරග විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කරගනු නොලැබේ.)

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2016.07.01 වැනි දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවර නොමැත.

7. *විභාග ගාස්තු* :- විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

8. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙ-පැත්ත භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 4.0 (ii) තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුර ලියනය කරන ලද අයදුම්පත්‍ද භාවිතා කළ හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නො-වන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) නිවැරදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2017 මාර්තු මස 20 වැනි දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016) II අදියර '' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

(*ඈ*) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(*ඊ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හේ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක්, එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තව ද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළුවීම :-

(*අ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයෙකු ම නියමිත විභාග ශාලාවට අදල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපෙක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන :- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

*සටහන* :-

i. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
ii. තම අයදුම්පත්‍රයෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය පසුව හෝ කිරීමට අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය :-

14.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර හතර (04) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 3 | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව) | 100 | 50 |
| 4. | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව) | 100 | 50 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2. සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

i. සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය*

i. ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ii. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය*

i. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණය මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාවය, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| | විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතාව | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂත්වය | 05 |
| | එකතුව | 25 |

ii. එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව හා අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. සාමාන්‍ය

සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

iv. පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන්වන (111) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සැළකිය යුතුයි :-

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www. results. exams. gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-

(01) සාමාන්‍ය බුද්ධිය

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළැඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 1/2 යි. ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ හා ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ ගෝලීය තත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(03) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදළව).

රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට අදළ රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(04) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

දෙන ලද මාතෘකාවන්/ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/ තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

16. සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 03 වැනි දින,

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016) II අදියර
Limited Competitive Examination for Recruitment to Grade III of
Sri Lanka Administrative Service - 2015 (2016) Stage II

1.0 මාධ්‍යය :-

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ---------- .
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ---------- .
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ---------- .

2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) : ---------- .

2.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ---------- .

2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :

2.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 විවාහක/ අවිවාහක බව : අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

2.10 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංක කොටුව තුළ ලියන්න)

2.11 උපන් දිනය : වර්ෂය මාසය දිනය

2.12 දුරකථන අංකය :

3.0 ඔබ 2016.07.01 දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. ————— .

4.0 (i) *ගැසට්* නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේ ද ?

(අ) 2016.07.01 දිනට වයස : ————— .

(ආ) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද,
*ගැසට්* නිවේදනයේ 06 (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 06 (ආ) i/(ආ) ii යන ඒවායින් කුමකින්ද යන්න.

උපාධිය ලද දිනය : ————— .
විශ්ව විද්‍යාලය/ආයතනය : ————— .
ලියාපදිංචි අංකය : ————— .
බාහිර/ අභ්‍යන්තර : ————— .
උපාධිය : ————— .
විෂයයන් : ————— .
පන්තිය : ————— .
ඉහළ/පහළ : ————— .
උපාධිය වලංගු දිනය : ————— .
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ————— .

(*ඇ*) විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් ඇත්නම්) සඳහන් කළ යුතු ය. : ————— .

දැනට දරන තනතුර :————— .
එම තනතුර අයත් වන්නේ මධ්‍යම රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න :————— .
ශ්‍රේණිය :————— .
පන්තිය/ඛණ්ඩය :————— .
තනතුරට පත්වූ දිනය :————— .
එම තනතුරේ ස්ථිර කළ දිනය :————— .
වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————— .

අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතු ය.

| *සේවය/ශ්‍රේණිය නම* | *අදාළ රා. පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය උදා. :MN 2-2016 (A)* | *පත්වූ දිනය* |
|---|---|---|
| (1) ………………………………… | ……………… | ……………… |
| (2) ………………………………… | ……………… | ……………… |
| (3) ………………………………… | ……………… | ……………… |
| (4) ………………………………… | ……………… | ……………… |
| (5) ………………………………… | ……………… | ……………… |

(ii) *ගැසට්* නිවේදනයේ 6 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2016.07.01 දිනට සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය :————— .

5.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වූ මීට පෙර පැවැත් වූ විභාගයන්ට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :———— .

| 2013 දෙසැම්බර් මස 23 වැනි දින අංක 1842/2 *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව (දැනට ක්‍රියාත්මක) 2012.07.01 දිනට පසු පෙනී සිටි වර්ෂයන් | *විභාගය* | *පෙනී සිටි/නොසිටි බව* |
|---|---|---|
| | 2013(2015) සීමිත | |
| | 2014 (2016) සීමිත | |

6.0 මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න.

| ලදුපත (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දරයකින් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න.) |
|---|

7.0 අයදුම්කරුගේ සහතිකය ඃ

2016.07.01 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 06(ආ) ඡේදයට අනුව 2016.07.01 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ..................... හා ..................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තවද විභාගය පැවත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

..............................
දිනය :————— . අයදුම්කරුගේ අත්සන

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................. මහතා / මහත්මිය / මෙනවිය මධ්‍යම රජය යටතේ වන/ ................... පළාත් සභාව යටතේ වන ................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................... තනතුරක සේවය කරන බවද, 2016.07.01 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, *ගැසට්* නිවේදනයේ 06 (ආ) ඡේදයට අනුව අවුරුදු .......... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහිත බවද, අදාළ *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බවද, මෙයින් සහතික කරමි.

............................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————— .
පදවි නාමය :————— .
දිනය :————— .
(නිලමුද්‍රාව යොදන්න.)

02-753

## ඇක්වයිනස් විශ්වවිද්‍යාල ආයතනය

ඇක්වයිනස් විශ්වවිද්‍යාල ආයතනයේ වැවිලි කළමනාකරණ පීඨයේ ඩිප්ලෝමා පාඨමාලාවන්ට
2017 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම

- වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- කෘෂිකර්ම ඉංජිනේරුවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

| | | |
|---|---|---|
| කාල සීමාව | : | මාස 26යි |
| දේශන | : | සති අන්ත සෙනසුරාදා දිනවල උදේ 10.00 - 3.00 දක්වා |
| මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි මිශ්‍ර |

- ආහාර විද්‍යාව සහ තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව
- සත්ත්ව පාලනය ඩිප්ලෝමා පාඨමාලාව
- මල් වගාව හා උද්‍යාන අලංකරණය ඩිප්ලෝමා පාඨමාලාව

| | | |
|---|---|---|
| කාල සීමාව | : | මාස 26යි |
| දේශන | : | සති අන්ත ඉරිදා දිනවල උදේ 10.00 - 3.00 දක්වා |
| මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි මිශ්‍ර |

ඇක්වයිනස් විශ්ව විද්‍යාල ආයතනය,
කොළඹ 08, ශ්‍රී ලංකාව.
පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරි - 0728173632
දුරකථන අංක : 2694014/15,4618689,0117389115/22 ෆැක්ස් අංකය : 0112678463 වෙබ් අඩවිය : *www.aquinas.lk*

02-778

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.